# ඇඹලුම් කර්මාන්ත ශාලාවල නියුතු සේවකයින් සඳහා පුහුණු තාක්ෂණ වැඩමුළු හරහා ස්වයං රැකියා සඳහා යොමු කිරීමේ වැඩපිළිවෙල.

## ( වතුරුගම හයිඩ්‍රාමනි ආයතනය)



**එන්.අයි .ඩී .සංවර්ධන ආයතනය**

# එන්.අයි .ඩී .සංවර්ධන ආයතනය

# පිළිබඳ තොරතුරු

හැදින්වීම

2006 වර්ෂයේ පටන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉසුරු ව්‍යාපෘතිය පදනම් කොටගෙන සමාජ සජීවිකරණය තුළින් ග්‍රාමීය හා නාගරික කාන්තාව සාමාජීය හා ආර්ථික වශයෙන් බලසතුකරණය කිරීම සිදු කෙරුණි.එම ව්‍යාපෘතිය අවසන් වීමත් සමඟ මෙම වැඩසටහන් මාලාව විවිධ ආයතන සම්බන්ධීකරණය කර ගනිමින් , ස්වෙච්ඡාවෙන් අවිධිමත් ලෙස ඉදිරියට පවත්වා ගනු ලැබුණි.වර්ෂ ගණනාවක් සමාජ සජීවීකරණය සහ සවිබල ගැන්වීම පිළිබඳ ලැබූ අත්දැකීම් පාදක කොට ගෙන සහ කාලීන අවශ්‍යතාවය මත පදනම්ව පුද්ගලයින් සවිබල ගැන්වීම සහ නැවත විධිමත් ලෙස මෙම සේවාව සැපයීම අරමුණු කරගනිමින් විද්වත් ආචාර්ය මණ්ඩලයක් ද ඒකරාශී කොට ගෙන 2022 වර්ෂයේ දී එන්.අයි.ඩී.සංවර්ධන ආයතනය ( N.I.D.DEVELOPMENT INSTITUTE ) යන නාමය යටතේ අප ආයතනය නිල වශයෙන් ලියාපදිංචි කරනු ලැබුණි.

## අපගේ දැක්ම

අප තිරසාර සංවර්ධනයට හා අත්වැල සපයමින් සරුසාර ශ්‍රී ලංකාවක් ගොඩනැගීමට දායක වන්නෙමු .

## අපගේ මෙහෙවර

බහුවිධ පුහුණු කිරීම් සහ මැදිහත්වීම් තුළින් පුද්ගල , කණ්ඩායම් සහ පවුල් ඒකක තිරසාරව සංවර්ධනය කරා ළඟා කරවීම.

# අපගේ අරමුණ

පුද්ගල විභවයතා සංවර්ධනය තුළින් ආර්ථික ශක්තිය ඵලදායි ලෙස ඉහළ නැංවීම.

# අපගේ කාර්යයන් සහ සේවාවන්

- නායකත්වය සහ පෞරුෂ සංවර්ධන වැඩමුළු.
- පුද්ගල සහ සේවක අභිප්ේරණ වැඩමුළු.
- කණ්ඩායම් මනෝ උපදේශන සහ රංග චිකිත්සක වැඩසටහන්.
- තාක්ෂණික පුහුණු (මැහුම්,පාවහන් නිෂ්පාදන,රසකැවිලි, බිම්මල්, බේකරි නිෂ්පාදන ආදී පුහුණු රැසක් ) වැඩසටහන්.
- ව්‍යවසායක උපදේශනය.
- අලෙවිකරණය සහ වෙළෙඳපොළ සම්බන්ධීකරණය.
- අවදානම් ණය කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩමුළු.

## තාක්ෂණික වැඩසටහන් පිළිබඳ හැදින්වීම

2023 මැයි 23 දින අපගේ ස්වහං රැකියා පිළිබඳ දැනුවත් කිරිමේ හා අභිප්‍රේරණ වැඩසටහන සාර්ථකව අවසන් වුණි .2023 -06-09 දින තාක්ෂණික පුහුණු පාඨමාලාවන් ආරම්භ කෙරුණි.

හයිඩ්‍රාමනී ආයතනයේ කළමනාකරු ඇතුළු මානව සම්පත් අංශයේ යෝජනාවකට අනුව සංවිධානය වූ මෙම තාක්ෂණික පුහුණු වැඩසටහන් පෙළගැස්ම හයිඩ්‍රාමණී ආයතනයේ සේවකයන්ගේ සුබසෙත උදෙසා ඔවුන්ගේ ජීවිතයට නව මාවතක් විවෘත කිරීමේ අරමුණින් මෙම වැඩසටහන් පෙළගැස්ම ආරම්භ කිරීමට යෝජිත විය.

103 ක පමණ සේවක කණ්ඩායමක් ජුනි මස 23 වන දින අපගේ පළමු හඳුන්වාදීමේ හා අභිප්‍රේරණ වැඩසටහනට සම්බන්ධ වුණි .එම පිරිස අතරින් 55 ක පමණ පිරිසක් අපගේ වැඩසටහන් සඳහා ඉතාමත් උනන්දුවෙන් හා කැපවීමෙන් සම්බන්ධ වූහ. එමෙන්ම එම පිරිස වැඩසටහන් ආරම්භයේ සිට අවසානය දක්වා රැඳී සාර්ථක ලෙස පාඨමාලා අවසන් කෙරුණ ලදි.ඒ අතරින් මගහැරුණු සේවක පිරිස වෙනත් රැකියාවන් සඳහා යොමු වූ බව පාඨමාලා සම්බන්ධීකාරකතුමියගේ විමසීම් තුළින් දැනගැනීමට හැකි විය.

තාක්ෂණික පුහුණු පාඨමාලා 12 ක් පමණ අප විසින් ඔවුන්ට හැදෑරීමට අවස්ථාව ලබාදුනි.පාඨමාලා සඳහා ඔවුන්ගේ කැමැත්ත පරිදි යොමු වීමටත් එක් අයෙකුට පාඨමාලා තුනක් සඳහා අයදුම් කිරීමටත් අවස්ථාව සලසා දුනි.

දස දෙනෙකුගෙන් පමණ සමන්විත ගුරු මණ්ඩලයක් අපගේ තාක්ෂණික පුහුණු පාඨමාලාවන් සඳහා දායක වුණි. අති සාර්ථක

ලෙස ආරම්භ වූ එම වැඩසටහන් සියල්ලම අපගේ අධීක්ෂණයන් යටතේ සිදු වුණි.

වැඩසටහනට සම්බන්ධ වූ පිරිසගේ අදහස වූයේ ලබාගත් දැනුම හා ප්‍රායෝගික පුහුණුව ඔවුන්ගේ ජීවිතවලට නැවුම් බලාපොරොත්තුවක් මෙන්ම ජීවිතයේ හැරවුම් ලක්ෂයක් ද වූ බවයි.ඔවුන්ට අලුතින් සිතීමට මෙන්ම අලුතින්ම තමන්ගේම ව්‍යාපාරයක් ගොඩනගා ගැනීමටත් , තමන්ගේම ව්‍යාපාරයට වෙළඳ නාමයක් සාදාගෙන නවීන ක්‍රම හරහා මාර්ගගත වෙළඳාමක් ලෙස සිදු කිරීමට අවශ්‍ය කරන මූලික අවබෝධය හා තමාට ලැබෙන මුදල ආයෝජනය කර ඉතිරි කරගෙන ආදායම සුරක්ෂිත කර ගන්නා ආකාරය මෙන්ම ව්‍යාපාරය තුළ ඇති අවදානමද අපගේ වැඩසටහන් සඳහා පැමිණි සියලු පිරිසට ලබා දීම සිදු කෙරුණි.මන්ද වර්තමානයේ ගෝලීයකරණය සමග දිනෙන් දින වෙනස් වන තාක්ෂණය මිනිසාගේ ජීවිතයට බද්ධ වී හමාරය.එබැවින් ව්‍යාපාරයන් සඳහා යොමුවන අපගේ නවකයින්ට ද මේ දැනුම අනිවාර්යයෙන් අවශ්‍ය වන නිසා වෙන්ම අප ආයතන කළමනාකාරතුමා ගේ අත්දැකීම් හා විවිධ පර්යේෂණ වල දත්ත මත මෙම ඒකකය පාඨමාලා තුළට සම්බන්ධ කෙරුණි.

ඇත්ත වශයෙන්ම අපගේ සාමාජික සියලුම දෙනා තම ව්‍යාපාර සිදු කිරීමට හා ව්‍යාපාර ප්‍රවර්ධනයට යොමුවීමේ ප්‍රවණතාවය දැක ගැනීමට ලැබීම සතුටට කාරණාවක් විය.

ජූනි 8 වන දින දික්කන්ද ගංගාරාම පන්සලේ ප්‍රධාන ශාලාවේ දී වැඩසටහන් සමාප්තිය හා අපගේ සාමාජික සාමාජිකාවන්ගේ නිෂ්පාදන ප්‍රදර්ශනය ද පැවැත්විමෙන් අනතුරුව සහතික පත්‍ර ලබා දීමෙන් පසු අපගේ පුහුණු වැඩසටහන සමාප්ත වුණි.එහිදී වැඩසටහන් සඳහා සම්බන්ධ වූ සියලුම දෙනා ව්‍යාපාර එකක් හෝ කිහිපයක් තෝරාගෙන ඒ තෝරාගත් ව්‍යාපාරයන් ඔස්සේ භාණ්ඩ නිෂ්පාදනය කර තිබුණි.

එදින ඔවුනට තම දක්ෂතාවයන් එළිදැක්වීමට කදිම අවස්ථාවක් කරගත් අපගේ සාමාජිකයන් අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ගෙන ඉතාමත් දක්ෂ ලෙස ඔවුන්ගේ වෙළඳ භාණ්ඩ හොඳ නිමාවක් සහිතව නිෂ්පාදනය කර තිබුණි.එය හයිඩ්‍රාමනි ආයතනයේ කළමනාකරුගේ හා දායකත්වය දැක්වූ මානව සම්පත් අංශයේ මහත්ම මහත්මීන්ගේ ද එන්.අයි.ඩී ආයතනයේ කළමනාකරු ඇතුළු සේවක සියල්ලන්ගේම අභිමානයට මෙන්ම මෙන් ම සතුට ගෙන දෙන කරුණක් විය.වැඩසටහන් සමාප්ති යෙන් පසු සිදුකරන ලද පසු විපරම තුලින් සනාථ වූයේ තාක්ෂණික පුහුණු වැඩසටහන් සඳහා සම්බන්ධ වූ පිරිසකගෙන් බොහෝමයක් දෙනා තම ව්‍යාපාරයන් සාර්ථක ලෙස සිදු කරගෙන යන බවයි.එලෙස සාර්ථක ලෙස පියවරක් ඉදිරියට තැබූ පිරිසකගෙන් කිහිප දෙනෙකු පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු මෙහි අන්තර්ගත කර ඇත.

# අපගේ නවක ව්‍යවසායකයින්

**තුෂාරි කොඩිතුවක්කු** මහත්මිය හායිඩ්‍රාමනි ආයතනයේ ද කැපී පෙනන සාමාජිකාවක් බව අපහට දැනගන්නට ලැබුණි.ඇය අපගේ පුහුණු වැඩසටහන් සියල්ලටම නොකඩවා සම්බන්ධ වූ සාමාජිකාවකි.එපමනක් නොව එතුමිය පුහුණු වැඩසටහන් ඉදිරියට කරගෙන යාම සඳහා නොමද සහයෝගයක් අපට ලබා දුනි.

එතුමිය මේ වන විටත් හොඳ ව්‍යවසායිකාවක් වී හමාරය. අප විසින් සිදුකරගෙන සිදු කර ගෙන යන ලද පසු විපරම තුළින් අපට දැනගන්නට ලැබුණේ එතුමිය සබන් , පාවහන් හා ටී ෂර්ට් මැසීමේ ව්‍යාපාරයක් සිදුකරගෙන යන බවයි.එහිදී ඇයට ටී ෂර්ට් මැසීම ට හොඳ ඉල්ලුමක් ඇති බව ඇය විසින් අපහට පවසන ලදී.ඇය මධ්‍ය ප්‍රමාණයේ කර්මාන්තයන් කිහිපයකින්ම ඇණවුම් ලබා ගෙන ටී ෂර්ට් මැසීමට යොමුවී ඇති අතර ඇය යටතේ තවත් සාමාජිකයින් කිහිප දෙනකු සේවයට ගැනීමටත් ඇය තීරණය කර ඇති අතර දින කිහිපයකින් එය ද ආරම්භ කරන බව ඇය පැවසීය.ඇයගේ සාර්ථකත්වය දෙස බලන අප සියලු දෙනාටම ඇත්තේ නිහතමානී සතුටකි.

26 හැවිරිදි **නිමේෂ්** අප ආයතනය හා සම්බන්ධවී ඔහුට අවශ්‍ය කරන දැනුම හා ප්‍රායෝගික දැනුම උපරිමයෙන් ලබා ගත් ශිෂ්‍යයෙකි.වයසින් එතරම් මුහුකුරා නොගියත් පාඨමාලා සඳහා සම්බන්ධ වූවන්ගෙන් ප්‍රථමයෙන්ම ව්‍යාපාරයක් ආරම්භ කළේ ඔහුය.ඔහු සබන් ව්‍යාපාරය ඉතාමත් හොඳට කරගෙන යන සාමාජිකයෙකි.ඒ සඳහා ඔහු " නිම් ලයිට් " යන වෙළෙඳ නාමය ද සදා හොඳ නිමාවක් සහිතව තම වෙළද භාණ්ඩය නිෂ්පාදනය කර පාරිභෝගිකයාගේ අතට ලැබීමට සලස්වයි.එපමණක් නොව ඔහු

විවිධ වගාවන් ද සිදුකරන අතර ඒවායෙහි පැල ද විකිණීම සිදුකරයි.තවද පාවහන් හා සේදුම්කාරක ද්‍රව්‍යය ද විකිණීමට ඔහු සමත්ව ඇත.

අපගේ පසුවිපරම සිදු කරන විට ඔහු පැවසුවේ ව්‍යාපාරය තව තවත් තව තවත් දියුණු කරගැනීමට ඔහුට දැඩි උනන්දුවක් ඇති බවත් දැනට තම ව්‍යාපාරයට හොඳ ලාභයක් ඇති අතර ඒ සඳහා හොඳ ඉල්ලුමක් ද ඇති බවයි.



**රමණී මහත්මිය** ඇඳුම් මැසීම සිදුකරන දිරිමත් කාන්තාවකි.ඇය තමාට ලැබී ඇති සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගෙන ඇත.එනම් ඇගේ නිවස පිහිටා ඇත්තේ ප්‍රධාන පාරක් අසලය.එම නිසා ඇය තම නිවසේ ම කොටසක් ඇඳුම් මැසීම සඳහා යොදාගෙන ඒ පිළිබඳ ප්‍රචාරණය සිදු කර ඇයගේ ව්‍යාපාරය දියුණු කරගෙන යනු ලැබේ. අප සිදු කළ පසු විපරමේදී ඇය පැවසුවේ දැනට ඇඳුම් විකුණන වෙළඳසැල් හතරකින් පමණ ඇණවුම් ලබා දෙන බවයි.සතියකට ඇඳුම් දෙසීයක් පමණ මැසීමට ඇයට ඇනවුම් ඇති බව ඇය පවසයි.එයින් ඇයට හොඳ ලාභයක් ඇති අතර තව තවත් ඇණවුම් ලබා ගැනීමට අවස්ථාව තිබෙන නිසාවෙන් ඇඳුම් මැසීම මැසීමට තවත් සේවකයින් දෙදෙනෙකු පමණ බඳවා ගැනීමට ද ඇයට අදහසක් තිබුණි .









චන්ද්‍රිකා සමරනායක මහත්මිය අපගේ වැඩසටහන් සඳහා සම්බන්ධ වූ තවත් සාමාජිකාවකි. ඇය සම්බන්ධ වූ පාඨමාලා අතරින් ඇය තෝරා ගත්තේ එක් පැත්තක් පමණි.නමුත් ඇය තෝරාගත් එක් පාඨමාලාවෙන් තමාගේ ම ව්‍යාපාරයක් ආරම්භ කළහ.චන්ද්‍රිකා මහත්මිය පාසල් ඇඳුම්,කාන්තා ඇඳුම්,සාරි හැට්ට මැසීම,ළමා ඇඳුම් ඇඳුම් හා බෑග් මැසීමට ඇණවුම් භාර ගන්නා අතර ඇයගේම වෙළඳ සැලක් ඇය ආරම්භ කළාය.එය නයනා ටේලර්ස් නමින් නම් කිරීමද සිදු කර වෙළඳසැල ආරම්භ කර මේ වන විටත් ඇය හොඳ මට්ටමක පසුවෙයි.









සමුද්‍රිකා මහත්මිය අපගේ තාක්ෂණික පුහුණු පාඨමාලා සඳහා සම්බන්ධ වූ තවත් එක් සාමාජිකාවකි.ඇය අපගේ පාඨමාලා සඳහා සම්බන්ධ වූයේ මහත් වුවමනාවකිනි.අපගේ වැඩසටහන් සඳහා සම්බන්ධ වූ සමුද්‍රිකා මහත්මිය තම සිත සවිමත් කරගෙන තමාගේම පුංචි හෝටලයක් එහෙමත් නැතිනම් ආපන ශාලාවක් ආරම්භ කරන ලදි. අපගේ පාඨමාලා අවසන් වීමටත් පෙර ඇය ඇයගේ ව්‍යාපාරය පටන් ගැන්නා ලදි.ඒ සඳහා විකිණීමට සාදන ලද සියලූ ආහාර පාන ඇයගේ අතින්ම නිපදවීම තවත් සුවිශේෂී කරුණකි.ඇය විසින් සාදන සියලු ආහාර පාන අප ආයතනය විසින් සිදුකරන ලද පාඨමාලා ආශිතව ගත් දැනුමෙන් බව ඇය පැවසුහ.

පසු විපරම තුළින් අපට දැනගැනීමට දැන ගැනීමට හැකි වූයේ ඇය ඉතාමත් සතුටින් හා  කැපවීමෙන් තම ව්‍යාපාරය සිදු කරන බවයි.එමෙන්ම ඇයගේ ව්‍යාපාරය දිනෙන් දින දියුණු කර ගැනීමට අවශ්‍ය බව ඇයගේ අදහස විය.



අනූෂා මහත්මිය ද අපගේ පුහුණු පාඨමාලා සියල්ලටම සම්බන්ධ වූ තවත් සාමාජිකාවකි.ඇය උසස් පෙළ ද හදාරා සිටී යෞවන වියේ පසුවන සාමාජිකාවකි.ඇයද තමාගේම වෙළඳසැලක් ආරම්භ කෙරන ලදි.එහි පාවහන්,ඇදුම් මැසීම,බෑග් විකිණීම හා මංගල කටයුතු සදහා අවශ්‍ය කරන පාවහන් තමා විසින්ම නිපදවා අලෙවි කිරිම සිදුකරයි.

එපමණක් නොව රූපලාවන්‍ය පාඨමාලාවක් හදාරා සිටි ඇය තමා විසින්ම සාදන ලද මංගල පාවහන් යුගලක් එම තරගයට ඉදිරිපත් කර තරගයට ඉදිරිපත් වූවන් ගෙන් හොඳම පාවහන් යුගල ඇගේ නිර්මාණය තේරී පත් වුණි.උත්සහය සහ  නිර්මාණශීලීත්වය ඇති ඇයගේ ව්‍යාපාරය දිනෙන් දින දියුණු වන බව හා පාවහන් සදහා ඉහළ ඉල්ලුමක් ඇති බව පසුවිපරම තුළින් අනාවරණය විය .









මේ ආකාරයට අපගේ පුහුණු පාඨමාලා සඳහා සම්බන්ධ වූවන්ගෙන් බොහොමයක් දෙනා ව්‍යාපාර ආරම්භ කර ඇති අතර එම ව්‍යාපාරයන් මේ වන විට සාර්ථක මට්ටමකට පත්ව ඇත.

## තාක්ෂණික පුහුණු පාඨමාලාවන් සඳහා සම්බන්ධ වීමෙන් පසු ව්‍යාපාර ආරම්භ කර ඇති සාමාජිකයින්ගේ විස්තර




සම්බන්ධ වූ පිරිස

ව්‍යාපාර අරම්භ කිරිමට යොජිතයි

ව්‍යාපාර අරම්භ කර ඇත

වෙනත් රැකියා සඳහා යොමු වී ඇත

# ස්තූතිය

මේ ආකාරයට ආරම්භ කරන ලද පාඨමාලා ඉතා සාර්ථක ලෙස නිමා විය. පාඨමාලා  පිළිබඳ කිසිම අවබෝධයක් නොමැතිව පැමිණි පිරිස පාඨමාලා අවසානයේ තමාගේම ව්‍යාපාරයක ආරම්භ කර ව්‍යවසායකයෙකු ලෙස වැඩසටහන සමාප්ත වීම ඉතාමත් සතුටට කරුණකි.මෙවැනි වටිනා සමාජ සත්කාරයක් ප්‍රජාවට ලබා දීමට හා රටේ ආර්ථිකය සවිමත් කිරීම සඳහා ඉඩ සලසා දුන් හයිඩ්‍රාමනී ආයතනයෙන් සියලුම නිලධාරීන් හට ස්තුතිය පුද කර සිටින අතර පාඨමාලාව සඳහා නොමද සහයෝගයක් ලබා දුන් අපගේ පාඨමාලා පුහුණුලාභින්ටද ස්තූතිය පුදකරන අතර පාඨමාලා සාර්ථක කරගැනීමට දැනුමෙන් හා ප්‍රායෝගික අත්දැකීමෙන් දායක වූ අපගේ ගුරු මඩුල්ල ට ද ගෞරව පූර්වකව ස්තූතිය පුදකරන අතර එන් අයි ඩී ආයතනයේ කළමනාකරු ඇතුළු සියලුම සාමාජිකයින් ලබා දුන් නොමද දායකත්වයට  ද ස්තූතිය පුදකර සිටිමු.